# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1872/13 - 2014 ජූලි මස 23 වැනි බදාදා - 2014.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : බිය3/1/1/231.

වර්ෂ 2011 ජූලි මස 25 වැනි දින අංක 1716/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 3464 දරන පිඹුරේ කැබලි අංක 58 දරන ඉඩම් කැබැල්ල කැබලි අංක 82 සහ 83 වශයෙන්ද, කැබලි අංක 51 කැබලි අංක 84 සහ 85 වශයෙන්ද, කැබලි අංක 34 කැබලි අංක 86 සහ 87 වශයෙන්ද, කැබලි අංක 24 කැබලි අංක 88 සහ 89 වශයෙන්ද සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 82**
ඉඩමේ නම: දවටගහවත්ත; ඉඩමේ විස්තර: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ශ්‍යාමලී වීරරත්න, මාවරමණ්ඩිය පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0072.

**කැබලි අංක 83**
ඉඩමේ නම: දවටගහවත්ත; ඉඩමේ විස්තර: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සුන්නාදෙනියගේ ගිහාන් ප්‍රසංග, මාවරමණ්ඩිය පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0005.

**කැබලි අංක 84**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; ඉඩමේ විස්තර: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. එච්. පෙරේරා, මාවරමණ්ඩිය පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0004.

**කැබලි අංක 85**
ඉඩමේ නම: මිල්ලගහවත්ත; ඉඩමේ විස්තර: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජස්ටින් පෙරේරා, මාවරමණ්ඩිය පාර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0020.

**කැබලි අංක 86**
ඉඩමේ නම: වරිපනම් අංක 845, මාවරමණ්ඩිය පාර; ඉඩමේ විස්තර: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඒ. ආනන්ද පෙරේරා, අංක 613, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0098.

**කැබලි අංක 87**
ඉඩමේ නම: වරිපනම් අංක 847, මාවරමණ්ඩිය පාර; ඉඩමේ විස්තර: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඒ. ගාමිණී පෙරේරා, අංක 613, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0064.

**කැබලි අංක 88**
ඉඩමේ නම: හොරගහලන්දවත්ත; ඉඩමේ විස්තර: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: හේමලතා වීරසිංහ, අංක 620, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0103.

**කැබලි අංක 89**
ඉඩමේ නම: හොරගහලන්දවත්ත; ඉඩමේ විස්තර: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අරුණ රුක්ෂාන් වීරසිංහ, අංක 620, මාකොළ උතුර, මාකොළ; ප්‍රමාණය: හෙක්. 0.0095.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 සැප්තැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

1A - G 19942 - 17 - (2014/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, 2014 සැප්තැම්බර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් පිඹුරු අංකය සහ කැබලි අංකය සඳහන් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2014 ජුනි මස 30 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 338

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : KR/DS/LA/J.K/WATER/2010.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2010/WS/206.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ පලවෙනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර:-

යාපනය දිස්ත්‍රික්කයේ, කාරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මොන්තිපුලම් ගමේ, පිහිටි සර්වේ ජනරාල්ගේ 2013.05.13 දිනැති කැඩැස්තර සිතියම් අංක 910401 කලාප අංක 01, පත්‍ර අංක 01 කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0619 මඩතුක්කාරෙයි හා වලන්තලෙයි නමැති පහත සඳහන් ඉඩම් කොටස, ප්‍රමාණය හෙක්ටයාර් 0.0619

**ඉඩමේ නම - මඩතුක්කාරෙයි හා වලන්තලෙයි;**
*උතුරට* : මඩතුක්කාරෙයි හා වලන්තලෙයි විත්තම්පරම් කෝවිල; *නැගෙනහිරට* : මඩතුක්කාරෙයි හා වලන්තලෙයි විත්තම්පරම් කෝවිල; *දකුණට* : මඩතුක්කාරෙයි හා වලන්තලෙයි විත්තම්පරම් කෝවිල; *බටහිරට* : මඩතුක්කාරෙයි හා වලන්තලෙයි විත්තම්පරම් කෝවිල (වෘත්තීය පුහුණු අධිකාරියේ පරිශ්‍රය).

ඉහත සඳහන් *ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 13 වැනි දින පෙ. ව. 10.00 ට කාරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2014 අගෝස්තු මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී. බාබු,
ප්‍රාදේශීය ලේකම්,
කාරෙයිනගර්.

2014 ජූලි මස 21 වැනි දින,
කාරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.